**ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම - 2018**

---

## 1. මතය

ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.1 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකැසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගැයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.4 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.4.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

-----------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී සමාගම ඈවර කිරීමට තීරණය කර තිබුණද, සමාගම ඈවර කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | සමාගම ඈවර කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) වෙත යවා ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගම ඈවරකිරීමට කටයුතු කල යුතුය. |

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 39 (1) වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, රේඛීය අමාත්‍යවරයා විසින් පත් කරන අධ්‍යක්ෂවරුන්ගෙන් සහ කොටස් හිමියන් පත් කරන අධ්‍යක්ෂවරුන්ගෙන් සැදුම්ලත් 07 දෙනෙකුගෙන් සමන්විත වියයුතු වුවත්, හතර දෙනෙකුගෙන් සමන්විත සමාගමේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කර තිබුණි. | සමාගමේ මහාසභා රැස්වීම්වලදී කොටස්කරුවන් වශයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් පමණක් සහභාගී වී ඇති අතර, අනෙකුත් කොටස්කරුවන් දෙදෙනාගේ සහභාගීත්වය නොමැති නිසා මහවැලි අධිකාරියට අධ්‍යක්ෂවරුන් පත්කිරීමට සිදුවී ඇත. | 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ නියමයන් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 5.1.3 ඡේදය | සමාගම පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමට ඉදිරි සැලසුම් ඇතුළත් කර සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2019 වර්ෂයේදී සමාගම ඈවර කිරීමට තීරණය කර ඇති බැවින්, කිසිදු කාර්යයක් ඉටුකිරීමට සමාගම භාරගෙන නැත. එම නිසා | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් අවශ්‍ය නොවීය. | |
| (ii) 6.5.1 ඡේදය | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වාර්ෂික වාර්තාව පිළියෙල කර මහ සභාවට ඉදිරිපත් කර ඇත. | චක්‍ර ලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) 2015 ජුනි 17 දිනැති අංක 03 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.2 වගන්තිය | සමාගම් වර්ගීකරණයේ අනුඛාණ්ඩ F යටතට ගැනෙන රජය සතු සමාගම්වල සභාපතිවරුන්ගේ මාසික දීමනාව ලබාගැනීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගතයුතු වුවත්, 2016, 2017 හා 2018 වර්ෂ වෙනුවෙන් සමාගමේ සභාපතිවරයා ලබාගෙන තිබුණු පිළිවෙලින් රු. 112,500 ක්, රු.450,000 ක් හා රු.450,000 ක දීමනා සඳහා අදාල අනුමතිය ලබාගෙන නොතිබුණි. | සමාගම E ඛාණ්ඩයට අයත් සමාගමක් සේ සලකා මේ දක්වා සභාපතිෂවරයාගේ දීමනාව ගෙවා ඇත. කෙසේ වුවද මුදල් අමාත්‍යාංශයේ Public Enterprises Circular No PED 3/2015 අනුව මේ සම්බන්ධ පැහැදිලි කරගැනීම් සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් දෙදෙනෙකු නම් කර ඇත. එසේ පැහැදිලි කරගැනීම සඳහා අවස්ථා කිහිපයකදීම ලිපි යවා ඇතත් කිසිදු පිළිතුරක් මේ දක්වා ලැබී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**02. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,267,070 පාඩුවක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 1,266,678 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 392 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාගමේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාරිසරික වාර්තා ලබාදීම සමාගමේ ප්‍රධාන කාර්යයක්වී තිබුණද ඒ සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහිත කාර්යය මණ්ඩලයක් සමාගම සතු නොවූ බැවින්, බාහිර පාර්ශවයකින් පාරිසරික වාර්තා සකස් කර ලබාගන්නා අතර, එම වාර්තාවල නිවැරදිභාවය සහතික කිරීමේ හැකියාවක් හෝ | ස්ථිර කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට වඩා එක් එක් කාර්යය සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත ලබාගැනීම සමාගමට වාසිදායක වේ. 2012 වර්ෂයේ සිටම සමාගම වසා දැමීමට තීරණය කර තිබූ බැවින්ද, ඊට පසුව පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදීද සමාගම වසා දැමීමට උපදෙස් දී තිබුණි. ඒ අනුව මෙම සමාගමේ | සමාගමේ ප්‍රධාන කාර්යයන් සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය සමාගට බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

සමාගම සතු නොවීය. තවද 2018 අධ්‍යක්ෂ මණ්ඩලය 2019 වර්ෂයේ කිසිම වර්ෂය වෙනුවෙන් එක් පාරිසරික ව්‍යාපෘතියක් භාර නොගැනීමට තීරණය කර වාර්තාවක් පමණක් පිළියෙල කර ඇත.
තිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ කාර්ය මණ්ඩලය 03 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, සමාගම සඳහා නිශ්චිත කාර්ය මණ්ඩලයක් හා ඊට අදාළව බඳවා ගැනීමේ කාර්ය පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්, තනතුරුවලට අදාළ සුදුසුකම් සහ වැටුප් තීරණය කිරීම්වල නිවැරදිභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය. | සමාගම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙළ කර ඇත. සමාගමේ පැවැත්ම අස්ථාවර නිසා 2012 වර්ෂයේ සිටම නිත්‍ය කාර්යය මණ්ඩලක් බඳවා ගැනීමට කටයුතු කර නොමැත. | ඇවරකිරීමේ කටයුතු කඩිනමින් නිමකිරීමට පියවර ගත යුතුය. |